# ජ්‍යෙෂ්ඨ පුරවැසියන් රැකියා සඳහා යොමුවීම කෙරෙහි බලපාන සාධක

අයි.එම්. දිසානායක - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

නාගරික සමාජයේ අඩු අදායම්ලාභී ප්‍රජාවන්ට අයත් *ජ්‍යෙෂ්ඨ පුරවැසියන්* කොන්ත්‍රාත් පදනම මත වෘත්තීන් සඳහා යොමුවීම දැකගත හැකිය. දෛනික වැටුප් පදනම මත සේවයේ යෙදෙන නාගරික කම්කරු ප්‍රජාව තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් බහුලය. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් (වියපත් ජනගහනය) ඉහළ යාම රටක ශ්‍රම බලකායයේ කාර්යක්ෂමතාවට සංඛ්‍යාත්මක බලපෑමක් ඇති කරයි. නාගරික අඩු ආදායම්ලාභී පවුල්වල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් (වියපත් වූවන්) බහුවිධ අපහසුතා තිබියදීත්, කොන්ත්‍රාත් පදනම මත වෘත්තීන් කෙරෙහි යොමුවන්නේ ඇයි ද යන්න කෙරෙහි මෙහිදී අවධානය යොමුකරන ලදී. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් රැකියා සහ ඉපැයීම් කෙරෙහි යොමුවීමට බලපාන සාධක හඳුනාගැනීම, ඔවුන් වැඩි වශයෙන් නියැළෙන වෘත්තීන් ප්‍රවර්ග හඳුනාගැනීම සහ ඔවුන්ගේ අනාගත වෘත්තීය අරමුණු හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය. අරමුණු සහගත ලෙස තෝරාගත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසි දෙනෙකු ඇසුරින් ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා සහ සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස්කරන ලදී. ඒ අනුව ලබාගන්නා ලද ගුණාත්මක දත්ත ඇසුරින් ලැබුණු සොයාගැනීම් මත ඔවුන් දෛනික වැටුප් ලැබෙන සුළු සේවාවල අඛණ්ඩව නියැළීමට බලාපොරොත්තු වන බවත්, සෞඛ්‍ය අවධානමක් හෝ ජීවිත අවධානමක් නොවුණහොත් දීර්ඝ කාලීනව මෙම රැකියාවල නියැළීමට කැමති බවත් දක්නට ලැබේ. එහිදී ඔවුන්ගේ වයස් සාධකය මත කොන්ත්‍රාත් හෝ දෛනික වැටුප් පදනමක් සහිත *නිල් කරපටි රැකියා* සඳහා යොමුවීමේ ප්‍රවණතාවක් ඇති බව හඳුනාගන්නා ලදී. සෘජුව දරිද්‍රතාවට මුහුණ දීමට සිදුවීම, හුදකලා වීමට ඇති අකමැත්ත, අධ්‍යාපනය අවම වීම, දිගු කාලින ඉතුරුම් ක්‍රමයක් නොමැති වීම, ශුන්‍ය ඉතුරුම් සහිත වීම, නිවාස පහසුකම් නොමැතිවීම, දරුවන් සහ ඥාති පිරිස් ආර්ථික වශයෙන් අපහසුතාවන්ට ලක් කිරීමට ඇති අකමැත්ත, වැඩිහිටි සුරකුම් මධ්‍යස්ථාන වෙත යොමුවීමට ඇති අකමැත්ත, තවදුරටත් පවුලේ ප්‍රධාන ඉපයුම්කරුවා වීම සහ අඛණ්ඩව ශ්‍රම දායකත්වය ලබාදීමට පවතින හැකියාව නිසා තවදුරටත් රැකියා සහ සේවාවන්හි නියැලීමට බලපාන සාධක වශයෙන් හඳුනාගන්නා ලදී. මේ අනුව ආර්ථිකමය පෙළඹවීම් මෙන්ම සමාජ සංස්කෘතිකමය පෙළඹවීම් මත නාගරික අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන බව සහ කොන්ත්‍රාත් පදනමක් සහිත රැකියා සඳහා යොමුවන බවත් පෙනී යයි.

**මුඛ්‍ය පද:** *කොන්ත්‍රාත් පදනම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, දරිද්‍රතාව, නිල කරපටි රැකියා*